**කළුතර නගර සභාව - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කළුතර නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කළුතර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතයේ 3 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පහත කරුණු කෙරෙහි අවධානය කර නොතිබුණි. | | |
| • සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව තැන්පතු වැඩිවීම රු.40,466 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල තැන්පතු වැඩිවීම රු.103,291 ක් ලෙස දැක්වීමෙන් රු.62,825 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.103,291 මුදල නිවැරදිව ගිණුම්ගත කර ඇති බව | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| • මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය ගණනයේදී තොගයේ වැඩිවීම ලෙස ස්ථාවර වත්කම් වල ඇති ඉන්වෙන්ට්‍රි තොගයට මාරුවීම තුලින් රු.2,932,194 ක තොගයේ වැඩිවීම මුදල් ගලා යාමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මුදල් ගලා ඒමක් හා ගලා යැමක් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ සිදුවී ඇති බැවින් නිවැරදිව ගිණුම්ගත කර ඇති බව | |

#### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)කටුකුරුන්ද සායන ගොඩනැගිල්ලේ මිදුල හා මායිම් තාප්පය ඉදි කිරීම සඳහා වැය කළ රු.1,411,054 ගොඩනැගිලි ගිණුමට හර කරනු වෙනුවට පුනරාවර්තන වැය ගිණුම හර කර තිබුණි. | අළුත්වැඩියාවන් යනු පවතින තත්ත්වයට පත් කිරීමක් බැවින් පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුල මාර්ගයන් හා කාණු ඉදි කිරීමට වැය වූ රු.1,357,736 පිරිවැය පාලම් , බෝක්කු හා පාරවල් ගිණුමට හර කරනු වෙනුවට පුනරාවර්තන වැය ගිණුම හර කර තිබුණි. | 2022 වර්ෂයේදී ගිණුම් සැකසීමේදී අඩුපාඩුව නිවැරදි කරන බව | |
| (ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලි ආදායම රු.260,518 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | කල් පිරීමේ දිනය එළඹීමට පෙර නිවැරදි පොලිය ගණනය කළ නොහැකි බැවින් පොලිය එලෙස ගිණුම්ගත කරන ලද අතර 2022 වර්ෂයේදී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව | |

| | | |
|---|---|---|
| (ඈ)සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.1,733,436 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයේ මාරු කිරීම් ලෙස දක්වා නොතිබීමෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන ජේදයේ සඳහන් රු.1,733,436 ක මුදල 2020.12.31 දිනට හඳුනානොගත් ප්‍රාග්ධන ප්‍රදානතුල තිබිය යුතු ශේෂයක් වන අතර සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන නොවන වියදම් රජයේ මාරු කිරීම්වල අන්තර්ගතව ඇති බව | . |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබූ රු.540,615 ක් වූ පුස්තකාල පොත් සඳහා ලද රු.77,615 වට්ටම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබීමෙන් පුස්තකාල පොත් රු.77,615 ක් ද ආදායම් රු.77,615 ක් ද අඩුවෙන් ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මගින් අදාල ගැලපීම් කර ඇති බව | |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදානරු.178,075 ක් වුවත්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස 2021 ජනවාරි 01 දිනට හඳුනානොගත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය වූ රු.805,572,543 ක් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ විස්තීර්ණ ආදායම රු.805,394,468 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති හා පළාත් පාලන කොමසාරිස් උපදෙස් හැරුණු විට ආවේනික වූ සංකල්ප හා උපකල්පන මත ගිණුම්ගත කර ඇති බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) ඉකුත් වර්ෂයේ ලැබී තිබුණ ප්‍රාග්ධන ප්‍රදාන රු.1,733,436 කින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ හෝ ඌණතාවයෙන් හඳුනාගත යුතු ප්‍රාග්ධන ප්‍රදාන රු.123,472 ක් වුවත්, වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ එය රු.26,520,484 ක් ලෙස එනම් රු.26,397,012 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් ප්‍රතිපත්ති අංක 3.4 යටතේ ලබාදෙන ලද උපදෙස් පරිදි කටයුතු කළ බව | |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අනුරූපී වාර්තාවල දැක්වෙන වටිනාකම අතර රු.439,314 ක වෙනසක් විය. | පොදු වැසිකිළි ආදායම ශීර්ෂ කිහිපයක් ඔස්සේ අදාල අංශ විසින් නිකුත් කර ඇති බව හා මස්කඩ ආදායම සංචරණ සීමා පැවති කාලය තුල අයකල නොහැකි ආදායම් ඇති බව | මූල්‍ය ප්‍රකාශන ශේෂ සහ උපලේඛන ශේෂ සමාන විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,481,432 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,892,054 ක් විය.

## 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) හිඟ වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වසර 10 ඉක්මවූ පැරණි හිඟ රු.1,548,977 ක්ද, වසර 05-10 ත් අතර හිඟ රු.1,667,598 ක්ද, වසර 03-05 ත් අතර හිඟ රු.2,459,020 ක් අයවිය යුතුව තිබුණි. | තව දුරටත් අයවීමට ඇති මුදල රු.27,120,597කි. | හිග ආදායම් කඩිනමින් අයකළ යුතුය. |
| (ආ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 සිට 2021අතර කාලය සඳහා ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.48,392,774 ක් විය. | උපලේඛන ලැබුණු විගස එහි ලේඛන සකස් කර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කරන බව | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අංක 41-7330 දරන ඉසුසු ලොරි රථයේ එන්ජිම අළුත්වැඩියා කිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත 2020 සැප්තැම්බර් 23 දින භාරදී තිබූ නමුත් එම ලොරි රථය අළුත්වැඩියා කර නැවත සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කෝරෝනා වසංගතය නිසා ආනයනික සීමා පැනවූ බැවින් අමතර කොටස් ගෙන්වා ගැනීම ප්‍රමාද විය . ඉතා ඉක්මනින් සභාවට ගෙන්වා ගැනිමට කටයුතු කරන බව | කඩිනමින් අළුත්වැඩියා කර වාහනය සභාව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ කාර්යාල කටයුතු පරිගණකගත කිරිම සඳහා රු.5,014,500 වටිනාකම වූ උපාංග 10 කින් සමන්විත පරිගණක මෘදුකාංග පද්ධතියක් මිලට ගෙන තිබූ අතර 2021 දෙසැම්බර් 31 වන විටත් උපාංග 05 ක් නිශ්ක්‍රියව පැවති අතර උපාංග 05 ක් ඌණ උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය. | ආදායම් කළමනාකරණ පද්ධතිය සියයට සියයක් ක්‍රියාත්මක වන අතර අනෙකුත් කළමනාකරණ පද්ධතිද 2022 වර්ෂය වන විට සියයට සියයක් ක්‍රියාත්මක කරන බව | වත්කම් ඌන උපයෝජනය නොකළ යුතුය. |